NCP/CS/ED/17/3- I

2025.11. 04

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ - 03/2025

උතුරු මැද පළාතේ
සියළුම ලේකම්වරුන්, නියොජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>උතුරු මැද පළාත් සභාවේ පුනරාවර්තන වියදම් දැරීම පිළිබඳ මාර්ගෝපදේශය.</u>

උක්ත හිසින් යුතුව මාගේ අංක NCP/CS/ED/5/01/II හා 2014.03.25 දිනැති ආයතන චක්‍රලේඛ අංක 2014/01 හා එහි සංශෝධනයන් හා බැඳේ.

02. 2025 වර්ෂයේ මෙතෙක් අවසන් නොවූ අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු නියමිත පරිදි අවසන් කිරීම සඳහා ඉහත චක්‍රලේඛනයේ මඟින් මා විසින් නිකුත්කර ඇති සීමාවන් 2025 නොවැම්බර්, දෙසැම්බර් හා 2026 ජනවාරි දක්වා වූ මාස 03 සඳහා පමණක් පහත දැක්වෙන පරිදි ලිහිල් කිරීමට තීරණය කර ඇත.

I. සතියේ දිනවල පැය 02 සීමාව ඉක්මවා අතිකාල සේවයේ යෙදවීම. (උපරිම පැය 03)
II. සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවල පැය 09 සීමාව ඉක්මවා අතිකාල සේවයේ යෙදවීම. (උපරිම පැය 12)
III. පූර්ණ කාලීනව කාර්යාල රාජකාරිවල යොදවා ඇති සංවර්ධන නිලධාරින්ට පැය 80 සීමාව ඉක්මවා ඉහත I හා II හි සඳහන් සීමාවන්ට යටත්ව අතිකාල සේවයේ යෙදවා ගැනීම.
IV. සේවයේ අවශ්‍යතාවය මත ක්ෂේත්‍ර හා කාර්යාලගත රාජකාරිවල සේවයේ යොදවා ඇති සංවර්ධන නිලධාරින් ඉහත I හා II හි සඳහන් සීමාවන් යටතේ උපරිම පැය 60ක් දක්වා අතිකාල සේවයේ යෙදවා ගැනීම.
V. වාර්ෂික ගිණුම් පියවීමේ කටයුතු සඳහා 2025 දෙසැම්බර් 25 දින සිට 31 දක්වා පමණක් ඉහත I හා II හි සඳහන් සීමාවන් ඉක්මවා සේවයේ අවශ්‍යතාවය මත වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ අතිකාල සේවයේ යොදවා ගැනීම.
VI. අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු පවතීනම් පමණක් මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඉරිදා දිනවල හා අනෙකුත් රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල කාර්යාල විවෘත කර අවශ්‍ය නිලධාරීන් පමණක් සේවයේ යොදවා ගැනීම.

03. මෙම සීමාවන් යටතේ නිලධාරීන් හා සේවකයින් සේවයේ යොදවා ගැනීමේදී සත්‍ය වශයෙන්ම අවසන් කිරීමට රාජකාරී කටයුතු පවතින බව අමාත්‍යාංශ ලේකම්වරු සෑහීමට පත්වීමෙන් අනතුරුව පමණක් මොවුන් සේවයේ යොදවා ගත යුතු අතර, එසේ සේවයේ යොදවා ගන්නා නිලධාරීන් අදාළ කාල සීමාව තුළ සක්‍රියව රාජකාරි වල යෙදී ඇති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් ඒ සඳහා ගෙවීම් කටයුතු සිදු කළ යුතුය. එසේම සීමා ලිහිල් කිරීම හේතුවෙන් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම් සඳහා අමතර ප්‍රතිපාදන ලබාදීම සිදු නොකරන අතර, 2025 වර්ෂයට වෙන් වී ඇති ප්‍රතිපාදන සීමාව තුළ අතිකාල සේවයේ යොදවා ගැනීමට සියළුම ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය. එමෙන්ම 2025 වසර තුළ ඉටු කළ යුතුව තිබූ කටයුත්තක් 2026 වසරට ගෙන නොයන බවට අතිකාල නිර්දේශ කරන නිලධාරියා වග බලා ගත යුතුය.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ
ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය
උතුරු මැද පළාත
අනුරාධපුර.